(50)

# සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
# நலன்புரி நன்மைகள் சபை
# WELFARE BENEFITS BOARD

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு

**Ministry of Finance, Economic Stabilaization & National Policies**

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | WBB/02/Notice/D/Div.S/2022 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2023 .07. 17 |

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**<u>"අස්වැසුම" සුබසාධක ප්‍රතිලාභීන් වෙත බැංකු ගිණුම් විවෘත කිරීම - නම සංශෝධනය කිරීම</u>**

"අස්වැසුම" සුබසාධක ප්‍රතිලාභීන් වෙත නව බැංකු ගිණුම් විවෘත කිරීම සඳහා අදාළ ලිපි ඔබ විසින් නිකුත් කිරීමේදී ප්‍රතිලාභී තේරීම් නාම ලැයිස්තුවේ සඳහන් ඇතැම් දෝෂසහගත නම් නිවැරදි කිරීමේ අවශ්‍යතාවයක් ඇති බවට හඳුනාගෙන ඇත.

02. ඒ අනුව, යම් නමක් දත්ත පද්ධතියට ඇතුළත් කිරීමේදී හෝ පරිවර්තනය කිරීමේදී සිදුව ඇති එවැනි පරිගණකගත දෝෂ නිවැරදි කිරීමට ඔබට අනුමැතිය ලබා දෙමි. එහෙත් අදාළ නම වෙනුවට වෙනත් පුද්ගලයෙකුගේ නමක් ආදේශනය වන ආකාරයේ කිසිදු සංශෝධනයක් සිදු නොකළ යුතු බව අවධාරණය කරමි.

03. මෙම නිවැරදි කිරීම් පරිගණක දත්ත පද්ධතිය තුළින් සිදු කිරීම සඳහා කල්ගත වන බැවින් පහත සඳහන් ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් එම සංශෝධන සිදු කරන මෙන් කාරුණිකව දන්වමි.

I. පරිගණක දත්ත පද්ධතියේ නම පවතින ආකාරයටම අදාළ ලිපිය මුද්‍රණය කරගන්න.

II. එහි සඳහන් නම අත් අකුරින් නිවැරදිව ලියා ලිපිය සංශෝධනය කර ප්‍රාදේශීය ලේකම් හෝ බලය පවරන ලද වෙනත් මාණ්ඩලික නිලධාරියෙකු විසින් අත්සන් කර නිකුත් කරන්න.

III. ඒ අනුව, අදාළ බැංකුව විසින් බැංකු ගිණුම විවෘත කර නිවැරදි නම පරිගණක දත්ත පද්ධතියට ඇතුළත් කරනු ඇත.

04. මෙයට අමතරව අයදුම්කරු මියගිය අවස්ථාවන් පිළිබඳවද වාර්තා වී ඇති අතර එවැනි අවස්ථාවකදී ග්‍රාම නිලධාරී මඟින් අදාළ මරණ සහතිකය සමඟ තහවුරු කිරීමක් ලබාගෙන පහත සඳහන් පරිදි කටයුතු කළ යුතුය.

I. **තනි පුද්ගලයෙකු වශයෙන් සුබසාධක ප්‍රතිලාභ ලැබීම සඳහා අයදුම්කර ඇති අවස්ථාවකදී එම පුද්ගලයා මියගොස් ඇත්නම්,** එම ප්‍රතිලාභියාගේ නම ප්‍රතිලාභී තේරීම් නාම ලැයිස්තුවෙන් ඉවත් කිරීම සඳහා ඒ බව සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය වෙත වාර්තා කළ යුතුය. මියගිය පුද්ගලයෙකුගේ බැංකු ගිණුමකට ආධාර මුදල් බැර කිරීම වළක්වාලීම සඳහා එසේ දැනුවත් කිරීම අනිවාර්යය වේ.

II. **සාමාජිකයින් කිහිපදෙනෙකුගෙන් යුතු පවුලක් වශයෙන් සුබසාධක ප්‍රතිලාභ ලැබීම සඳහා අයදුම්කර ඇති අවස්ථාවකදී අයදුම්කරු මියගොස් ඇත්නම්,** අයදුම්කරුගේ කලත්‍රයාට හෝ එම පවුලේ වගකීම දරණ ඊළඟ ප්‍රධාන සාමාජිකයාට බැංකු ගිණුමක් විවෘත කිරීම සඳහා අවස්ථාව ලබා දිය යුතුය.


| | | | | | |
|---|---|---|---|---|---|
| කාර්යාලය<br>அலுவலகம்<br>Office | Tel: 009411- 2151481<br>009411- 2484600/4117<br>Fax: 009411- 2151482 | විද්‍යුත් තැපැල<br>மின்னஞ்சல்<br>e-mail | welfarebenefitboard2016@gmail.com<br>info@iwms.wbb.gov.lk | වෙබ් අඩවිය<br>இணையதளம்<br>Website | www.wbb.gov.lk |

- ඒ අනුව, පරිගණක දත්ත පද්ධතියේ අයදුම්කරුගේ (මියගිය තැනැත්තාගේ) නම පවතින ආකාරයටම අදාළ ලිපිය මුද්‍රණය කරගෙන පෙර සඳහන් කළ අදාළ තැනැත්තාගේ නම හා ජාතික හැඳුනුම්පත් අංකය අත් අකුරින් ලියා ලිපිය සංශෝධනය කර ප්‍රාදේශීය ලේකම් හෝ බලය පවරන ලද වෙනත් මාණ්ඩලික නිලධාරියෙකු විසින් අත්සන් කර නිකුත් කළ යුතුය.

- ජාතික හැඳුනුම්පතක් නොමැති නම් එම තැනැත්තාගේ ඡායාරූපය මඟින් අනන්‍යතාවය සහතික කර ලිපියක් නිකුත් කළ යුතුය. මෙම ලිපියද පරිගණක දත්ත පද්ධතියේ පවතින ආකාරයටම මුද්‍රණය කරගෙන අත් අකුරින් ලියා නම සංශෝධනය කර ප්‍රාදේශීය ලේකම් හෝ බලය පවරන ලද වෙනත් මාණ්ඩලික නිලධාරියෙකු විසින් අත්සන් කර නිකුත් කළ යුතුය.

ඒ අනුව, අදාළ බැංකුව විසින් බැංකු ගිණුම විවෘත කර නිවැරදි නම පරිගණක දත්ත පද්ධතියට ඇතුළත් කරනු ඇත.

05. තවද, මෙම ලිපි නිකුත් කිරීමේදී මුද්‍රිත ලිපියේ සඳහන් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සභාපතිගේ මුද්‍රා අත්සනට අමතරව අදාළ ප්‍රාදේශීය ලේකම් (හෝ ඔහු වෙනුවට බලය දී ඇති වෙනත් මාණ්ඩලික නිලධාරියෙකු) විසින් සිය අත්සන හා නිල මුද්‍රාව යොදා එම ලිපි නිකුත් කළ යුතු බවද කාරුණිකව දන්වා සිටිමි.

06. "අස්වැසුම" සුබසාධක ප්‍රතිලාභ පිරිනැමීම සඳහා බැංකු ගිණුම් විවෘත කිරීමට අදාළව බැංකු ගිණුමක් නොමැති සහ පවත්නා ගිණුමේ වලංගුභාවය තහවුරු කරගෙන නොමැති ප්‍රතිලාභීන් (ජාතික හැඳුනුම්පතක් සහිත) හා බැංකු ගිණුමක් නොමැති සහ පවත්නා ගිණුමේ වලංගුභාවය තහවුරු කරගෙන නොමැති ප්‍රතිලාභීන් (ජාතික හැඳුනුම්පතක් නොමැති) යන මැයෙන් පරිගණක දත්ත පද්ධතියට ඇතුළත් කර ඇති ලිපි ආදර්ශන්හි දෘඩ පිටපත් ඔබගේ දැනගැනීම සඳහා මේ සමඟ ඉදිරිපත් කරමි. (පිළිවෙළින් ඇමුණුම 01 හා 02)

ආර්.පී.ආර්. රාජපක්ෂ
අතිරේක කොමසාරිස් (මෙහෙයුම්)
කොමසාරිස් වෙනුවට

පිටපත:

1. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් - කා.දැ.ස.

2023. 07. 17 දින සංශෝධනය කරන ලද ලිපිය

(120)

" ආදර්ශයකි"

................................................................................(අයදුම්කරුගේ නම)

................................................................................(අයදුම්කරුගේ ලිපිනය)

................................................................................

මහත්මයාණෙනි/මහත්මියනි/මෙනවියනි,

**"අස්වැසුම" සුබසාධක ප්‍රතිලාභ පිරිනැමීම සඳහා බැංකු ගිණුම් විවෘත කිරීම**
**බැංකු ගිණුමක් නොමැති සහ පවත්නා ගිණුමේ වලංගුභාවය තහවුරු කරගෙන නොමැති ප්‍රතිලාභීන්**
**(ජාතික හැඳුනුම්පතක් සහිත)**

"අස්වැසුම" සුබසාධක ප්‍රතිලාභ පිරිනැමීමේ වැඩසටහන යටතේ මූලික තේරීම් ලැයිස්තුව අනුව ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ඔබ ද සුදුසුකම් ලබා ඇති බව ඔබ වෙත දන්වා සිටිමි. එහෙත් මෙම සුදුසුකම්ලාභීන්ට අදාළව අභියාචනා සහ විරෝධතා කැඳවා ඒවා පරික්ෂා කිරීමෙන් පසුව සිදුවිය හැකි සංශෝධනවලට යටත්ව ඔබ වෙත ප්‍රතිලාභ දීමනා සෘජුව ලබාදීම සඳහා බැංකු ගිණුමක් විවෘත කිරීමට අවශ්‍යව තිබේ. එබැවින් ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරිකිරිමේ බැංකුව හෝ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ශාඛාවක ඔබේ මනාපය පරිදි ඉතිරිකිරිමේ ගිණුමක් විවෘත කර ගන්න. ඔබට තැපැල් කාර්යාලයක් මඟින් බැංකු ගනුදෙනු කිරීම පහසුවන්නේ නම් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තැපැල් කාර්යාලීය ඉතිරි කිරීමේ ගිණුමක් විවෘත කළ හැකි බව ද පෙන්වා දෙමි. ඔබට , ආරම්භක තැන්පතුවක් නොමැතිව ගිණුමක් විවෘත කිරීමටද මෙම බැංකු විසින් ඉඩකඩ ලබාදී ඇති බවද දන්වමි. ඔබ යම් කායික අපහසුතාවයකින් පෙළෙන අයෙක් නම් ඔබට විශේෂ සේවාවක් ලබාදීමට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව එකඟ වී ඇත.

තවද ඔබට බැංකු ගනුදෙනු කිරීම සඳහා යාමේ ඒමේ යම් අපහසුතා හා සාක්ෂරතා දුර්වලකම් ඇත්නම් ඔබේ පවුලේ සාමාජිකයකු සමඟ බද්ධ ගිණුමක් විවෘත කිරීමට ද හැකියාව ඇති බවදන්වා සිටිමි.

ස්තුතියි.

මෙයට ඔබගේ විශ්වාසී,

බී. විජයරත්න
සභාපති/ කොමසාරිස්
සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය

......................
ප්‍රාදේශීය ලේකම්
(නිල මුද්‍රාව)

2023.07.17 දින සංශෝධනය කරන ලද ලිපිය

……………………………………………………………………(අයදුම්කරුගේ නම) "ආදර්ශයකි"

……………………………………………………………………(අයදුම්කරුගේ ලිපිනය) 119

……………………………………………………………………

මහත්මයාණෙනි/මහත්මියනි/මෙනවියනි,

**"අස්වැසුම" සුබසාධක ප්‍රතිලාභ පිරිනැමීම සඳහා බැංකු ගිණුම් විවෘත කිරීම**
**බැංකු ගිණුමක් නොමැති සහ පවත්නා ගිණුමේ වලංගුභාවය තහවුරු කරගෙන නොමැති ප්‍රතිලාභීන්**
**(ජාතික හැඳුනුම්පතක් නොමැති)**

"අස්වැසුම" සුබසාධක ප්‍රතිලාභ පිරිනැමීමේ වැඩසටහන යටතේ මූලික තේරීම් ලැයිස්තුවට අනුව ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ඔබ ද සුදුසුකම් ලබා ඇති බව දන්වමි. එහෙත් මෙම සුදුසුකම්ලාභීන්ට අදාළව අභියාචනා සහ විරෝධතා කැඳවා ඒවා පරීක්ෂා කිරීමෙන් පසුව සිදුවිය හැකි සංශෝධනවලට යටත්ව ඔබ වෙත ප්‍රතිලාභ දීමනා සෘජුව ලබාදීම සඳහා බැංකු ගිණුමක් විවෘත කිරීමට අවශ්‍යව තිබේ. එබැවින් ලංකා බැංකුවේ ජාතික ඉතිරිකිරීමේ බැංකුව හෝ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ශාඛාවක ඔබේ මනාපය පරිදි ඉතිරිකිරීමේ ගිණුමක් විවෘත කර ගන්න. ඔබට තැපැල් කාර්යාලයක් මගින් බැංකු ගනුදෙනු කිරීම පහසුවන්නේ නම් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තැපැල් කාර්යාලීය ඉතිරි කිරීමේ ගිණුමක් විවෘත කළ හැකි බව ද පෙන්වා දෙමි. ඔබට , ආරම්භක තැන්පතුවක් නොමැතිව ගිණුමක් විවෘත කිරීමටද මෙම බැංකු විසින් ඉඩකඩ ලබා දී ඇති බවද දන්වමි.ඔබ යම් කායික අපහසුතාවයකින් පෙළෙන අයෙක් නම් ඔබට විශේෂ සේවාවක් ලබාදීමට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව එකඟ වී ඇත.

අප වෙත ඇති තොරතුරු අනුව ඔබට ජාතික හැඳුනුම්පතක් නොමැති බැවින් පහත සඳහන් ආකෘතිපත්‍රය සම්පූර්ණකර එහි සෙන්ටිමීටර් 4.5x3.5 ප්‍රමාණයේ ඔබේ උඩුකය ඡායාරූපයක් අලවා ප්‍රාදේශීය ලේකම් මගින් අනන්‍යතාවය සහතික කර බැංකු ශාඛාවට භාරදීමට කටයුතු කරන්න.

තවද ඔබට බැංකු ගනුදෙනු කිරීම සඳහා යාමේ ඒමේ අපහසුතා හා සාක්ෂරතා දුර්වලකම් ඇත්නම් නම් ඔබේ පවුලේ සාමාජිකයකු සමඟ බද්ධ ගිණුමක් විවෘත කිරීමට ද හැකියාව ඇති බවද දන්වා සිටිමි.

ස්තුතියි.

මෙයට ඔබගේ විශ්වාසී,

බී. විජයරත්න
සභාපති/ කොමසාරිස්
සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය

……………………………
ප්‍රා දේශීය ලේකම්
(නිල මුද්‍රාව)

---

"අස්වැසුම" සුබසාධක ප්‍රතිලාභ පිරිනැමීම සඳහා බැංකු ගිණුම් විවෘත
(ජාතික හැඳුනුම්පතක් නොමැති අයදුම්කරුවන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම). ඇමුණුම

කළමනාකරු
ලංකා බැංකුව/ ජාතික ඉතිරිකිරීමේ බැංකුව

අයදුම්කරුගේ නම:………………………………………

ලිපිනය: ………………………………………

………………………………………

4.5cmx3.5cm
ඡායාරූපය

සහතික කිරීම

……………………………
ක්ෂේත්‍ර නිලධාරී අත්සන

නිල මුද්‍රාව

……………………………
ප්‍රාදේශීය ලේකම් අත්සන

නිල මුද්‍රාව